# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන)

**1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා විසින්
2022 ජූලි මස 06 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ජුනි මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[124 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන)

## 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක    දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 15(8) (ඇ) වන වගන්තියට අනතුරුව පහත සඳහන් නව වගන්තිය එකතු කළ යුතු අතර, එය මුල් පනතේ 15(9) වන වගන්තිය යනුවෙන් ක්‍රියාත්මක විය යුතු යː-

"15(9)(1) සෑම දේශපාලන පක්ෂයක් සහ ස්වාධීන කණ්ඩායමක් විසින් නාමයෝජනා ඉදිරිපත් කිරීමේ දී, එම දිස්ත්‍රික්කයේ නියමිත ඡන්ද අපේක්ෂක සංඛ්‍යාවෙන් හතරෙන් පංගුවකට නොඅඩු සංඛ්‍යාවක් තරුණයන් විය යුතු අතර, දිස්ත්‍රික් ලැයිස්තුවෙන් හතරෙන් පංගුවක් තරුණ අපේක්ෂකයන්ගෙන් සමන්විත විය යුතු ය:

මෙහි දී නාමයෝජනා කැඳවමින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයට සමගාමීව, එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා අදාළ නාමයෝජනා පත්‍රිකාවේ නාමනය විය යුතු තරුණ අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව නිශ්චිත වශයෙන් සඳහන් විය යුතු ය.

(2) මෙම වගන්තියේ තරුණයකු වශයෙන් නිර්වචනය වන්නේ, මැතිවරණ කොමසාරිස්වරයා විසින් මැතිවරණය කැඳවනු ලබන දිනයට වයස අවුරුදු 35ක් හෝ ඊට අඩු පුරුෂ හෝ ස්ත්‍රී තැනැත්තෙකි.

(3) ඉහත 15(9)(1) වගන්තිය ප්‍රකාර අවශ්‍යතාවය සැපිරීමට අපොහොසත් වන්නා වූ යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් වේතොත්, තේරීම්භාර

නිලධාරියා විසින් එකී නාමයෝජනා පත්‍රය ශුන්‍ය වූවා සේ සලකා අවලංගු කර, ප්‍රතික්ෂේප කළ යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.